# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2045/38 - 2017 නොවැම්බර් මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2017.11.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

*මගේ අංක* : IR/13/25/2011.

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.08.15 දිනැති හා අංක 1823/60 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2013.07.11 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තිස්සමහාරාමය, දෙබරවැව, 2 වන පටුමග, මැද වැලැන හි පදිංචි කේ. එච්. සුනිමල් මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, සෙත්සිරිපාය හි පිහිටි මාර්ග සංවර්ධන අධිකාරිය වන අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.06.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 නොවැම්බර් මස 11 වන දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*මගේ අංකය* : IR/13/25/2011.

### කාර්මික අධිකරණයේ දී ය.

කේ. එච්. සුනිමල් මහතා.
මැද වැලැන,
2 වන පටුමග, දෙබරවැව,
තිස්සමහාරාමය.

*පළමු පාර්ශ්වය*

*නඩු අංකය* : ඒ-3516

සහ

මාර්ග සංවර්ධන අධිකාරිය.
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

දෙවන පාර්ශ්වය

## ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා ගරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම පිණිස, කරන ලද පත්කිරීම 2013. 08.08 වන දින දරන ලිපිය මගින් මා වෙත යොමුකර ඇත.

එකී යොමුකිරීම අනුව පාර්ශවකරුවන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

2006 වර්ෂයේ ජූනි මාසයේ හෝ ඊට ආසන්න කාලයක සිදුවීමක් මුල්කරගෙන පවත්නා ලද විනය පරීක්ෂණයකින් පසුව කේ. එච්. සුනිමල් මහතා වෙත ලබා දී ඇති දඬුවම කොතෙක් දුරට යුක්තිසහගතද යන්න හා එසේ නොමැති නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

කාර්මික අධිකරණයෙන් කරන ලද නියමය අනුව දෙපාර්ශ්වය විසින්ම නීතිඥ නියෝජනය සහිතව පෙනී සිටිමින් තම තමන්ගේ ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

අනතුරුව මෙම කරුණ විමසීම සඳහා දින නියම කර කැඳවන ලද අවස්ථාවේ දෙපාර්ශ්වය අතරේ සමථයක් කර ගැනීමට හැකියාවක් ඇත්දැයි විමසා බැලූ අවස්ථාවේ ඒ සඳහා පාර්ශ්වකරුවන් එකඟතාව දක්වූයෙන්, සමථයක් ඇතිකරගැනීම සඳහා කාලය ලබාදුන් නමුත් සමථයකට එළඹීමට නොහැකි වූයෙන් මෙම කරුණ විමසීමේ කටයුතු ආරම්භ කරන ලදී.

පළමු පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ආරම්භ කරමින් ඉල්ලුම්කාර කේ. එච්. සුනිමල් යන අය මූලික සාක්ෂි ඉදිරිපත් කර ඇති අතර, ඔහු හරස් ප්‍රශ්නවලට භාජනය වී නැවත ප්‍රශ්න ද අසා ඇත.

වගඋත්තරකාර ආයතනයෙන් සාක්ෂි ආරම්භ කරමින් මාර්ග සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ පාලන උදයගිරි ආරච්චිලාගේ රංජිත් උදයගිරි යන අයගේ මූලික සාක්ෂි ඉදිරිපත් කර හරස් ප්‍රශ්න ඇසීමට නියමිතව තිබුණත්, පළමු පාර්ශ්වයට නීතිඥ සහය ලබාගැනීමට නොහැකි වී ඇති හෙයින් එදින හරස් ප්‍රශ්න ඇසීමක් සිදු කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් පළමු පාර්ශ්වය මේ අවස්ථාවේ දී තම ආරවුල සමථයකට පත් කර ගැනීමට කැමැත්තක් දක්වන බවත්, ඔහු අපේක්ෂා කරන්නේ, ඔහුට උසස්වීම ලබාදීමෙන් අනතුරුව එය අත්හිටුවා ඇති බැවින්, එකී උසස්වීම යථාපරිදි ඔහුට ලබාගැනීම පමණක් බවත් ය. තමා විසින් ඉල්ලුම්පත්‍රයේ ඉල්ලා ඇති අනෙකුත් සහනයන් අත්හැරීමට එකඟවන බවත් කාර්මික අධිකරණයේ දී ප්‍රකාශ කර ඇත. ඒ අනුව මෙම ආරවුල සමථයකට පත්කර ගැනීමට සලකා බලන ලෙස කාර්මික අධිකරණයේ බේරුම්කාරතුමිය විසින් වගඋත්තරකරු වන දෙවන පාර්ශ්වය වෙත දැනුම් දෙන ලද අතර ඒ සම්බන්ධයෙන් විමසා බැලීම සඳහා 2016.02.23 දින පාර්ශවකරුවන් කැඳවන්නට යෙදුනි.

සමථය සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා 2016 පෙබරවාරි 23 වන දින මෙම නඩුව කැඳවනු ලැබූ අවස්ථාවේ, දෙපාර්ශවයේම නීතිඥ නියෝජනය සහිතව දෙපාර්ශවයට පුද්ගලිකව පෙනී සිටිමින් ද දෙපාර්ශවය අතර ඇති ආරවුල සමථයට පත් කර ගැනීමට එකඟතාවයකට පැමිණ ඇති බව දන්වමින් ඒ අනුව විනය නියෝගය හේතුවෙන් අත්හිටුවන ලද පළමු පාර්ශ්වය වෙත 2010.07.12 වන දින කාර්මික නිලධාරි තනතුරට ලබා දී ඇති උසස්වීම, ඒ ආකාරයෙන්ම 2010.07.12 වන දින සිට බලාත්මක වන ලෙස පළමු පාර්ශවයට ලබා දීමටත් සහ ඔහුට එදින සිට පසු වේතන ලබා දීමටත් දෙවන පාර්ශවය එකඟ වී ඇති අතර, පළමු පාර්ශවයද එයට එකඟතාවය පළකර ඇතිබවත් දන්වන ලදින් සමථ, කොන්දේසි සඳහා එකඟතාවයට පත්ව දෙපාර්ශවයම නඩු වාර්තාවට අත්සන් තබන ලදී.

කෙසේ වෙතත් සමථය පරිපූර්ණ කර ඇති දැයි සලකා බැලීම සඳහා 2016.06.29 වන දින, පාර්ශවකරුවන් නැවත කැඳවන ලද අතර, පළමු පාර්ශවය වන කේ. එච්. සුනිමල් විසින් සමථය සම්පූර්ණ කර, ඔහුට පත්වීමේ ලිපිය හා පසු වේතන ආදියත් දෙවන පාර්ශවය විසින් ලබා දුන් බවත්, ඒ අනුව එකී තනතුරේ ඔහු සේවයේ යෙදෙන බවත් ප්‍රකාශ කරමින්, සමථය පරිපූර්ණ වූ බවට පිළිගනිමින් අත්සන් තබන ලද ලේඛනයක් ද නඩු වාර්තාවට ගොනුකරමින් අවසාන වශයෙන් මේ ආරවුල සමථයට පත් වී ඇති බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව පාර්ශවකරුවන් එකඟ වූ පරිදි සමථයේ කොන්දේසි පරිපූර්ණ කර ඇති බවට නිගමනය කරමි. මෙය යුක්ති සහගත හා සාධාරණ සමථයක් බවට පිළිගනිමින් මෙම නීතිකෘතය අවසන් කරමි.

එන්. ඒ. ජයවික්‍රම මහත්මිය.
බේරුම්කරු,
කාර්මික අධිකරණය.

2017 ජුනි මස 20 වන දින.
කාර්මික අධිකරණයේදී ය.

11-1395

---

*මගේ අංක* : IR/13/25/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2010.11.19 දිනැති හා අංක 1680/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010.11.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොටපොල, ගල්දෙල, *''රණගිරිඹි,* අංක 45 හි පදිංචි අයි. ඩී. එස්. සමරවීර මිය හා අනෙක් පාර්ශවය වශයෙන් ගාල්ල, වංචාවල, මැලැගොඩ, ගල්ගමුකන්ද හි පිහිටි සීමාසහිත සම්බෝධි සුබසාධක සමිතිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.07.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 නොවැම්බර් මස 11 වන දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කම්කරු දෙපාර්තමේන්තුව

කාර්මික අධිකාරණයේ දී ය.

අයි. ඩී. එස්. සමරවීර මිය,
අංක 45, ''රණගිරි'',
ගල්දෙල,
කොටපොල.

බේරුම්කරණ අංකය : A 3359

සහ

සීමාසහිත සම්බෝධි සුබසාධක සමිතිය
ගල්ගමුකන්ද,
මැලැගොඩ,
වංචාවල,
ගාල්ල.

වර්ෂ 2010.11.10 දතමින් කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් ගරු කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය ගාමිණි ලොකුගේ මැතිතුමා හට පැවරී ඇති බලතල ප්‍රකාර පහත සඳහන් කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා

බේරුම්කරු ලෙස මා පත් කරන ලදුව එකී කාරණය සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ඩබ්ලිව්. ජේ. එල්. යූ. විජයවීර මහතා විසින් වර්ෂ 2010.09.07 දින කාර්මික ආරවුල් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව මෙසේ ඉදිරිපත් කර ඇත.

එකී කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ 1984 වර්ෂයේ දී සම්බෝධි භාරය යටතේ ලිපිකාරිණියක වශයෙන් සේවයට බඳවා ගනු ලැබූ අයි. ඩී. එස්. සමරවීර මහත්මිය සීමාසහිත සම්බෝධි සුබසාධක සමිතිය යටතේ සේවය කරමින් සිටිය දී 2014.12.08 දින සිට ඇයට නිවාඩු අනුමත කර ඇතත් මේ දක්වා ආපසු සේවයට කැඳවා නොතිබීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් සිදු වී ඇත් ද? යන්න හා අසාධාරණයක් වූයේ නම් අයි. ඩී. එස්. සමරවීර මහත්මියට කුමන සහනයක් හිමිද යන්න පිළිබඳව ය.

අයි. ඩී. එස් සමරවීර මහත්මිය වර්ෂ 2010.12.06 දින ද සම්බෝධි සුබසාධක සමිතිය විසින් 2010.12.10 දිනද ඊට පිළිතුරු ලෙස අයි. ඩී. එස්. සමරවීර මහත්මිය 2011.01.05 දින ප්‍රකාශයක්ද ලිපි ලේඛන සමග ඉදිරිපත් කර ඇත.

මෙම නඩුව ආරම්භයේදීම මවිසින් මෙම කාරණය සමථයකට පත්කිරීම සඳහා උත්සාහ දැරුවද ඒ සම්බන්ධයෙන් වගඋත්තරකාර සමිතිය කැමැත්ත පළ නොකළ නිසා 2012.06.26 දින විභාගය ආරම්භ විය.

ඉල්ලුම්කාරිය වන අයි. ඩී. එස්. සමරවීර මහත්මිය A1 සිට A8 දක්වා ලේඛන සලකුණු කරමින් තම මූලික සාක්ෂිය දුන් අතර හරස් ප්‍රශ්න අධක් විමසමින් VI සිට V5 දක්වා ලේඛන සළකුණු කළ අතර මෙලෙස මෙම කාරණය අධක් විමසා තිබිය දී 2014.09.09 දින පාර්ශවයන් සමථයකට එළඹීමට එකග වූයෙන් ඒ අනුව පහත සඳහන් සමථයට දෙපාර්ශවය විසින් එකඟ විය.

එකී සමථය නම්,

ඉල්ලුම්කාර පාර්ශවය වෙත පසුගිය කාලය සඳහා මාස 06 ක වැටුපක් ගෙවීමට වග උත්තරකාර පක්ෂය එකඟ වේ. ඒ අනුව එකී මුදල රු. 48000/= බව දෙපාර්ශවයම පිළිගනී. එකී ගෙවීම අවසානාත්මක ගෙවීමක් බවද තවදුරටත් දෙපාර්ශවය පිළිගනී. කෙසේ වුවත් යම් ව්‍යවස්ථාපිත දීමනාවක් වේ නම් එය ලබා ගැනීමට ඉල්ලුම්කාරියට අයිතිය ඇති අතර ඇයට හිමි පාරිතෝෂක දීමනාව එකී අයගේ සේවා කාලය අනුව ගණනය කළ යුතුය.

මෙකී සමථය පරිදි මාගේ ප්‍රදනය වන්නේ මෙම නඩුව දෙපාර්ශවය විසින් සමථයකට පත් කර ගත් හෙයින් ඉල්ලුම්කාර පාර්ශවය වෙත මාස 6ක වැටුපක් එනම් රු 48000/= ක මුදලක් වගඋත්තරකාර පාර්ශවය ගෙවිය යුතුය. එම ගෙවීම මෙම ආරවුලට හේතුව ඇති කාරණය සම්බන්ධයෙන් අවසානාත්මක ගෙවීමක් විය යුතුය. යම් ව්‍යවස්ථාපිත දීමනාවක් වේනම් එය ලබා ගැනීමට ඉල්ලුම්කාරියට අයිතිය අති අතර ඇයට හිමි පාරිතෝෂික දීමනාව ඒ ආකාරයෙන්ම වගඋත්තරකාර පක්ෂය විසින් ගණනය කොට ගෙවිය යුතුය. මෙම ගෙවීම් සම්බන්ධව යම් ගැටලුවක් ඇත්නම් මෙම නඩුව ඉල්ලුම්කාරියට මෝසමක් මගින් කැඳවිය හැකිය.

තවද මෙම සමථය ප්‍රකාර වගඋත්තරකාර පක්ෂය ඉල්ලුම්කාරියට අද දින ගෙවන ලද රු 16000/= ක මුදලට අමතරව ඉතිරි මුදල වන රු. 32,000/= ක මුදල ඉල්ලුම්කාරියට ලබාගත හැකි වන ලෙසත්, මෙකී ප්‍රදනය *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් අනතුරුව මාස 02 ක කාලයක් තුලදී සහකාර කම්කරු කොමසාරිස් ගාල්ල වෙත තැන්පත් කරන ලෙසත් නියම කරමි. ඉල්ලුම්කාරියට හිමි පාරිතෝෂිත දීමනාවක් අප්‍රමාදව ගණනය කොට වගඋත්තරකාර පක්ෂය විසින් ඉල්ලුම්කාරියට ගෙවිය යුතුය. මෙය සාධාරණ හා යුක්තිසහගත ප්‍රදනයක් වන හෙයින් මෙසේ ප්‍රකාශයට පත් කරමි.

ලොයිඩ් ගල්හේන,
බේරුම්කරු.

2017 ක් වූ ජූලි මස 24 වන දින දීය.

11-1396

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.